Archaeological Society of Sri Lanka

# පුරාවිද්‍යා පුවත්

ශ්‍රී ලංකා පුරාවිද්‍යා සංගමයේ චතුර්මාසික පුවත් හසුන

12 වෙළුම
2 කලාපය
2016
මැයි - අගෝ.

## පණස් වන සංවත්සර වාර්ෂික මහා සභා රැස්වීම පැවැත්වේ

**ශ්‍රී ලංකා පුරාවිද්‍යා සංගමයේ පණස්වන සංවත්සර මහා සභා රැස්වීම 2016 මාර්තු මස 13 වනදා සවස කොළඹ 7, රාජකීය ආසියාතික සමිති සභාශාලාවේදී, සංගමයේ ගරු සභාපති ආචාර්ය මහින්ද පී. මලලසේකර මහතාගේ ප්‍රධානත්වයෙන් හා හිටපු සභාපති මහාචාර්ය විනී විතාරණ මහතාගේ සහභාගිත්වයෙන් යුතුව පවත්වන ලදි.**

ගරු සභාපති මලලසේකර මහතා විසින් සභාව පිළිගැනීමෙන් අනතුරුව, ගරු සමලේකම්වරුන් විසින් පසුගිය වර්ෂයේ මහා සභා රැස්වීමේ වාර්තාව හා 2015/2016 වර්ෂය සඳහා වූ ප්‍රගති වාර්තාව සභාගත කරන ලදි. ඒ අනුව සංගමය විසින් 2015 මාර්තු සිට 2016 පෙබරවාරි දක්වා වූ කාලයේදී දේශන දොළහක් (12) පවත්වා ඇති අතර, මේ කාලයේදී සාමාජිකයන් විසිඑක්දෙනකු (21) සංගමයේ සාමාජිකත්වය ලබා තිබේ. ඉන්පසුව ගරු භාණ්ඩාගාරික විසින් ඉදිරිපත් කරන ලද 2015 වර්ෂයේ වාර්ෂික ගිණුම් ප්‍රකාශයද සභා සම්මත විය.

2016/2017 වර්ෂ සඳහා නව නිලධාරි මණ්ඩලය සඳහා විධායක සභාව විසින් ඉදිරිපත් කරන ලද නාමයෝජනා හැර වෙනත් නාමයෝජනා ඉදිරිපත්ව නොතිබූ බැවින්, එම නාමයෝජනා සම්මත විය. (එදින පත් වූ නව නිලධාරි මණ්ඩලය පසුපිටේ දක්වේ.)

පුරාවිද්‍යා සංගමයේ අනුශාසකවරුන් ලෙස මහාචාර්ය චන්ද්‍රා වික්‍රමගමගේ, මහාචාර්ය පී. එල්. ප්‍රේමතිලක හා සිරිනිමල් ලක්දුසිංහ යන මහත්වරුන් පත් කළ යුතු බවට විධායක සභාව ඉදිරිපත් කළ යෝජනාවද සභා සම්මත විය.

සංගමයේ ව්‍යවස්ථාවේ 9 වන වගන්තිය වන ''ව්‍යවස්ථා සංශෝධනය වාර්ෂික රැස්වීමක දී කළ යුතුය. එවැනි සංශෝධන වලංගු වන්නේ පැමිණ සිටි සංඛ්‍යාවෙන් තුනෙන් දෙකක ඡන්ද ලදහොත් පමණය.'' යන වගන්තිය, ''ව්‍යවස්ථා සංශෝධනය වාර්ෂික මහා සභා රැස්වීමක දී හෝ විශේෂ මහා සභා රැස්වීමකදී කළ යුතුය. එවැනි සංශෝධන වලංගු වන්නේ පැමිණ සිටි සංඛ්‍යාවෙන් තුනෙන් දෙකක ඡන්ද ලදහොත් පමණය.'' යනුවෙන් සංශෝධනය සඳහා ඉදිරිපත්ව තිබූ යෝජනාවද සම්මත විය.

සංවත්සර සභාව අමතමින් සංගමයේ ගරු සභාපති මලලසේකර මහතා සභාවට දැනුම්දුන්නේ පණස්වන සංවත්සර වැඩසටහන් ලබන සැප්තැම්බර් මාසයේදී පමණ පැවැත්වීමට අපේක්ෂා කරන බවයි.

වාර්ෂික මහා සභා රැස්වීමේ කටයුතු ප.ව. 3.00ට පමණ නිමාවට පත් වූ අතර ඉන්පසුව තේපැන් සංග්‍රහයක්ද පවත්වන ලදි.

## පුරාවිද්‍යා සංගමයේ ස්වර්ණ ජයන්ති උත්සවය සැප්තැම්බර් මාසයේදි

ශ්‍රී ලංකා පුරාවිද්‍යා සංගමයේ ස්වර්ණ ජයන්තිය නිමිත්තෙන් පැවැත්වීමට නියමිත විශේෂ ස්වර්ණ ජයන්ති උත්සවය ලබන සැප්තැම්බර් මාසයේ මුල්භාගයේදී පමණ කොළඹදී පැවැත්වීමට සැලසුම් කර තිබේ.

මේ යටතේ සමරු මුද්දරයක් නිකුත් කිරීම, සංවත්සර සම්මන්ත්‍රණය, රචනා තරගයේ ත්‍යාග ප්‍රදානෝත්සවය හා සඟරාවේ විශේෂ කලාපයක් එළිදැක්වීම යන කටයුතු සැලසුම් කර තිබේ.

විස්තර මීළඟ පුවත්හසුන මගින් ඔබ වෙත දැනුම් දෙනු ලැබේ.

## මාසික වැඩසටහන්

ශ්‍රී ලංකා පුරාවිද්‍යා සංගමයේ මාසික අධ්‍යාපන වැඩසටහන යටතේ ඉදිරි මාස හතරේදී පැවැත්වීමට නියමිත දේශන මෙසේය.

- **මැයි 8 ඉරිදා ප.ව. 2.30ට**

  දේශන මාතෘකාව:
  පුරාවිද්‍යාවෙන් මා උගත් දෑ
  දේශක:
  මහාචාර්ය විනී විතාරණ මහතා (හිටපු සභාපති, ශ්‍රී ලංකා පුරාවිද්‍යා සංගමය)

- **ජුනි 12 ඉරිදා ප.ව. 2.30ට**

  දේශන මාතෘකාව:
  කොළඹ කොටුව - එහි ආරම්භය, වර්ධනය හා පරිහානිය
  දේශක:
  ක්‍රිෂේන් මෙන්ඩිස් මහතා (සාමාජික, ශ්‍රී ලංකා පුරාවිද්‍යා සංගමය)

- **ජූලි 10 ඉරිදා ප.ව. 2.30ට**

  දේශන මාතෘකාව:
  ශ්‍රී ලංකාවේ මැටි රූප (terracotta) භාවිතය සහ ශ්‍රී ලංකාවේ මැටි රූප හමුවී ඇති ස්ථානීය අවකාශය හා පරිසර සන්දර්භයන් පිළිබඳ විමර්ශනයක්
  දේශක:
  මේනකා නිශාන්ති මිය (සහකාර පුස්තකාලයාධිපති, ශ්‍රී ජයවර්ධනපුර විශ්ව විද්‍යාලය)

- **අගෝස්තු 14 ඉරිදා ප.ව. 2.30ට**

  දේශන මාතෘකාව:
  අම්පාර රජගල පුරාවිද්‍යා භූමියේ අවකාශීය ව්‍යාප්ති රටාව පිළිබඳ විමර්ශනයක්
  දේශක:
  ඉනෝජ් අබේනායක මහතා (සහකාර කථිකාචාර්ය, ශ්‍රී ජයවර්ධනපුර විශ්ව විද්‍යාලය)

**මෙම වැඩසටහන් කොළඹ 7, ආනන්ද කුමාරස්වාමි මාවතේ, අංක 96 දරණ තැන පිහිටි රාජකීය ආසියාතික සමිතියේ රැස්වීම් ශාලාවේදී පැවැත්වේ. (මහවැලි කේන්ද්‍ර ගොඩනැගිල්ලේ පළමු මහළේ)**

- මෙම දේශන පැවැත්වෙන දිනවල ප.ව. 1.00ට සංගමයේ විධායක සභා රැස්වීම පැවැත්වෙන බව කරුණාවෙන් සලකන්න.

## ශ්‍රී ලංකා පුරාවිද්‍යා සංගමයේ ලිපිනය හා දුරකථන අංක


ලිපිනය - සංජීවනී විද්‍යාරත්න මිය
සම්බන්ධීකරණ ලේකම්
ශ්‍රී ලංකා පුරාවිද්‍යා සංගමය
ජාතික කෞතුකාගාරය බාරේ
ශ්‍රීමත් මාකස් ප්‍රනාන්දු මාවත
කොළඹ 07.

විද්‍යුත් තැපැල -
archaeology.org.lk@gmail.com

වෙබ් අඩවිය -
www.archaeology.org.lk

**ගරු සභාපති**

- මහින්ද මලලසේකර 072-3322411

**ගරු ජ්‍යෙෂ්ඨ උප සභාපති**

- රංජිත් හේවගේ 071-1712894

**ගරු උප සභාපති**

- කාවන් රත්නතුංග 071-7072020

**ගරු සමලේකම්වරු**

- සමන් අබේසිංහ 071-4864783
- බෙනට් ප්‍රනාන්දු 071-8335882

**ගරු සම්බන්ධීකරණ ලේකම්**

- සංජීවනී විද්‍යාරත්න 071-5872591


## නිවේදන

- සාමාජික අයදුම්පත් සංගමයේ වෙබ් අඩවියෙන් PDF ලේඛනයක් ලෙස බාගත කළ (download) හැකිය.
- පුරාවිද්‍යා සංහිතා 2, 3 හා 5 කලාප සංගමයේ රැස්වීම්වලදී හා සරසවි හා කියවන නුවණ (නුගේගොඩ) පොත්හල්වලින් ලබාගත හැකිය.
- අපගේ Google කණ්ඩායමේ ඊමේල් පණිවුඩ නොලැබේද? එසේ නම් Subject ලෙස Add යොදා ඉහත සඳහන් සංගමයේ ඊ-මේල් ලිපිනයට ඊ-මේල් පණිවුඩයක් එවන්න.

## පුරාවිදු පුවත් සංස්කරණය

ධනේෂ් විසුම්පෙරුම
ගරු සංස්කාරක

## පුරාවිද්‍යා සංගමයේ 2016/2017 නිලධාරි මණ්ඩලය

ශ්‍රී ලංකා පුරාවිද්‍යා සංගමයේ 2016 මාර්තු මස 13 වන දින පැවැති වාර්ෂික මහා සභා රැස්වීමේදී 2016/2017 වර්ෂය සඳහා පත් වූ නව නිලධාරි මණ්ඩලය මෙසේය.

| | | |
|---|---|---|
| ගරු සභාපති | : | ආචාර්ය මහින්ද පී. මලලසේකර |
| ගරු ජ්‍යෙෂ්ඨ උප සභාපති | : | රංජිත් හේවගේ |
| ගරු උපසභාපති | : | ආචාර්ය කාවන් රත්නතුංග |
| ගරු සමලේකම්වරු | : | සමන් අබේසිංහ<br>බෙනට් ප්‍රනාන්දු |
| ගරු සම්බන්ධීකරණ ලේකම් | : | සංජීවනී විද්‍යාරත්න |
| ගරු භාණ්ඩාගාරික | : | ලක්ෂ්මන් රත්නායක |
| ගරු සංස්කාරක | : | ධනේෂ් විසුම්පෙරුම |
| ගරු විධායක සභිකවරු (8) | : | බන්දු වීරවර්ධන<br>හේමතිලක බණ්ඩාර<br>මුදිත කරුණාමුනි<br>සී. එච්. ඉද්දගොඩ<br>රුක්ෂිලා සංජීවනී<br>සිරිල් ආරියපාල<br>යොහාන් පෙරෙයිරා<br>නිතීඥ ජීමී මාරඹේ |

## සාමාජිකයන්ගේ නව ප්‍රකාශන

### "පොලොන්නරුවේ පැරණි ස්මාරකයන්හි චිත්‍රගත සැරසිලි මෝස්තර"

**කර්තෘ - සරත් ඥානසිරි මල්දෙණිය**

සෞන්දර්ය කලා විශ්ව විද්‍යාලයේ මූර්ති කලා අධ්‍යයනාංශයේ මහාචාර්ය සරත් ඥානසිරි මල්දෙණිය මහතා විසින් රචනා කළ පර්යේෂණ ග්‍රන්ථයක් වන *'පොලොන්නරුවේ පැරණි ස්මාරකයන්හි චිත්‍රගත සැරසිලි මෝස්තර'* නම් කෘතිය පසුගිය පෙබරවාරි මස එළිදක්වන ලදි.

පුරාවිද්‍යා සංගමයේ කාරකසභිකයකු ලෙස වසර කිහිපයකට පෙර කටයුතු කළ මල්දෙණිය මහතා දේශන කිහිපයක්ද පවත්වා ඇත.

### "තුන් කල් දුටු පරණවිතාන"

**කර්තෘ - සිරිසමන් විජේතුංග**

පුරාවිද්‍යා දෙපාර්තමේන්තුවේ හිටපු සහකාර අධ්‍යක්ෂවරයකු වන සිරිසමන් විජේතුංග මහතා විසින්, ශ්‍රී ලංකාවේ පළමු ලාංකික පුරාවිද්‍යා කොමසාරිස්වරයා වූ මහචාර්ය සෙනරත් පරණවිතාන මහතාගේ චරිතය හා කාර්යභාරය අලලා රචනා කරන ලද *'තුන් කල් දුටු පරණවිතාන'* නම් ග්‍රන්ථය පසුගියදා එළිදක්වන ලදි.

සිරිසමන් විජේතුංග මහතා අප සංගමයේ කාරකසභිකයකු හා නිලධාරියකු ලෙස කලකට පෙර කටයුතු කළ අතර, වරින්වර සංගමයේ සාමාජිකයින් වෙනුවෙන් දේශන රැසක්ම පවත්වා ඇත.


**පුරාවිදු පුවත්** - ශ්‍රී ලංකා පුරාවිද්‍යා සංගමයේ සාමාජිකත්වය වෙනුවෙන් පලකෙරෙන චතුර්මාසික පුවත් හසුනයි.



**ආපසු:**
සංජීවනී විද්‍යාරත්න මිය
සම්බන්ධීකරණ ලේකම් - ශ්‍රී ලංකා පුරාවිද්‍යා සංගමය
ජාතික කෞතුකාගාරය බාරේ
ශ්‍රීමත් මාකස් ප්‍රනාන්දු මාවත
කොළඹ 07.